# Abstract No 79

## තෛත්තිරීයෝපනිෂදාගත කර්මසිද්ධාන්තය පිළිබඳ අධ්‍යයනයක්

**පූජ්‍ය මස්පන්නේ හේමරතන හිමි**
පරිවේණාචාර්ය, විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙණ, හොරණ.
mhhemarathana@gmail.com

පෙරදිග දාර්ශනික චින්තාවේ ආරම්භය අවම වශයෙන් වසර 5000කට වත් එපිට ට දිවයයි. වෛදික, බ්‍රාහ්මණ, ආරණ්‍යක යුගයන්හි සංකල්ප මිශ්‍ර වීමෙන් බිහි වූ සුවිශේෂී යුගයක් ලෙස උපනිෂද් යුගය හඳුනාගත හැකි ය. වෛදිකයේ අවසන් යුගය ලෙස හැඳින්වෙන්නේ උපනිෂද් යුගය යි. උපනිෂද් යන්නෙන් ළඟ හිඳුවා කියා දීම යන්න අර්ථවත් වේ. එසේ ළඟ හිඳුවා විවිධ දාර්ශනික සංකල්පයන් පිළිබඳ රහසිගත ව ආචාර්යවරයා සමීපයේ දී සාකච්ඡා කිරීමට යොමු ව ඇත. එහි දී තෛත්තිරීයෝපනිෂදය තදීය සාහිත්‍යයේ අමරණීය කෘතියකි. එහි කර්මය, පුනර්භවය, ආත්මය, සංසාරය, මරණය ආදි වූ ගැඹුරු ප්‍රස්තුත වඩාත් පුළුල් ලෙස සාකච්ඡා වේ. ඒ අනුව තෛත්තිරීයෝපනිෂදයේ කර්ම සංකල්පය පිළිබඳ ව අපගේ අවධානය යොමු කිරීමට අපේක්ෂිතය. මෙම පර්යේෂණයේ දී තෛත්තිරීයෝපනිෂදය, එහි කර්ම සංකල්පය හා එහි විශේෂත්වය අධ්‍යයනය කිරීම ග්‍රන්ථ අධ්‍යයනය වැනි පර්යේෂණ ක්‍රමවේද භාවිත කරන ලදි. ඒ අනුව උපනිෂද්හි ප්‍රබල ව ආත්මය හා ස්වච්ඡන්දතාව මෙන් ම ඊශ්වර සංකල්පය ද සාකච්ඡා වේ. මෙම සංකල්ප අතරට බ්‍රහ්මන් හා ආත්මන් සංකල්පය ප්‍රධාන වන අතර එම සංකල්පය, කර්මය, පුනරුත්පත්තිය වැනි සංකල්ප එයින් පෝෂණය කොට තිබේ. යාග කිරීම, දන් දීම, යහපත් ක්‍රියා කිරීම, සත්‍යය පැවසීම, වැනි කර්මය හා සම්බන්ධ තොරතුරු ඉන් කිහිපයකි. වන්දනය, යාගය ආදිය මෝක්ෂයට එතරම් වැදගත් නැති බව උපනිෂදයන්ගේ පිළිගැනීම යි. කර්මානුරූපී ව සත්ත්වයා සුගති හා දුගතිගාමී භවයන් ලබන බව උපනිෂද් මුනිවරු දන සිටියහ. එහෙත් කර්මය පිළිබඳ ව ද ගැඹුරු අදහසක් පැවති බවක් නො පෙනේ. බුද්ධකාලය වන තෙක් විකාශනයට පත් වූ මෙම අදහස්වල දාර්ශනික හා ගැඹුරු බවක් බෞද්ධ දර්ශනයේ දක්නට ඇත. මෙමඟින් පෙන්නුම් කරන කරුණක් වන්නේ ක්‍රමානුකූල ව දාර්ශනික සංකල්පයන්ගේ වර්ධනයක් ඇතිවීම කෙරෙහි උපනිෂදයන්ගේ ද බලපෑමක් වූ බව යි. උපනිෂද්හි යහපත් ක්‍රියා කොට සුවපත් ජීවිතයක් ගෙවන ලෙස දක්වන අතර එම කර්මයන් ද අතහැර බ්‍රහ්මන් හා එක්වන ලෙස ශිෂ්‍යයාට පෙන්වා දෙයි. එය කර්මයෙහි උපනිෂද් නියෝජනය හා අර්ථ නිරූපණය පෙන්වා දෙයි. ඒ අනුව උක්ත තෛත්තිරීයෝපනිෂදය කර්ම සිද්ධාන්තය පිළිබඳ සුවිශේෂී අවධානයක් යොමු කොට ඇති බව අපගේ නිගමනය යි.

**ප්‍රමුඛ පද ඃ-** උපනිෂද් ,තෛත්තිරීයෝපනිෂදය, කර්ම සිද්ධාන්තය